

# ධර්මය සහ යථාර්ථය 1

**අන්ධයන් සේ මිථ්‍යාව පසුපස දුවන බෞද්ධයන්ටයි.**

*ආගම් ඇදහීමේදී වර්තමාන ශ්‍රී ලංකාවේ බැතිමතුන් ප්‍රතිපත්ති පූජාවට ලැබෙන වැදගත්කම යටපත් කොට ආමිස පූජාවට ප්‍රමුඛ වැදගත්කමක් ලබාදී තිබෙන බව දැකිය හැකිය. ඒ අළලා මීට දශක කිහිපයකට ඉහතදී ආචාර්ය වල්පොළ රාහුල හිමියන් පළ කළ අදහස් කොටස් වශයෙන් පළකරනු ලබන්නේ ඒ අදහස් එදාට වඩා අදට වලංගුයැ'යි පෙනෙන නිසාය. මෙම ලිපි පෙළ ධර්මය ගැන උනන්දුවක් දක්වන්නන්ගේ අවධානයට යොමු කරන ලෙස අපි පාඨකයන්ගෙන් ඉල්ලා සිටිමු.*

*අනුග්‍රහය රාවය*

## වල්පොළ රාහුල හිමි

**බුද්ධ පූජාවට ඔබ විරුද්ධ යන ආරංචියක් පැතිරී තිබේ. මේ පිළිබඳව සත්‍යය කුමක්දැයි දැනගැනීමට කැමැත්තෙමි.**

මම කිසිසේත් බුද්ධ පූජාවට විරුද්ධ නොවෙමි. යළි, මම එය කිරීමට බලවත් ලෙස අවවාද කරන්නෙක්මි. ආමිස - ප්‍රතිපත්තිය යන ද්විවිධ පූජාවටම තථාගතයන් වහන්සේ තරම් සුදුස්සෙක් නැත. අද බෞද්ධයෝ බුද්ධ පූජා නොකරති. බුදුරජාණන්වහන්සේට සුදුසු පූජා නොපවත්වති. " බුදුධ පූජා" යන උතුම් ලේබලය පිටතින් අලවා නොඑක් විකාර කරති. විහාර මළුවක පිනුම් ගැසීමක්, නොඑක් විහිළු තහළුවලින් යුත් පෙරහරක් යෑමත්, ප්‍රතිමාවක් ඉදිරියේ ආහාරපාන වර්ග තැබීමත්, තවත් අනේකප්‍රකාර විකාර කිරීමත් බුද්ධ පූජා ලෙස සලකති. මේවා උන්වහන්සේට සුදුසු පූජා නොවෙති.

**'බුද්ධ පූජා' යන වචනයෙන් මා අදහස් කළේ බුද්ධ ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර පාන වර්ග තැබීමයි. මෙය අපේ පරම්පරාගතව එන චාරිත්‍ර ධර්මයකි. ඔබ ඊට විරුද්ධ ද ?**

විරුද්ධකම කෙසේ වෙතත්, ඒ පිළිබඳ මගේ අදහස අද රටේ පිළිගත් මතයට වෙනස් බව නම් ඇත්තකි.

**ඒ කුමක් ද ?**

එය බුද්ධ පූජාවක් නොවේය යනුයි.

**ඔබේ අදහස භයානකයි, අන්තරාදායකයි, එය මිථ්‍යාදෘෂ්ටියකි.**

ප්‍රිය මිත්‍රය, කලබල නොවනු මැනවි, නොකිපෙනු මැනවි, යම්කිසි කරුණක් පිළිබඳව තමාට නුපුරුදු අලුත් මතයක් පිළිබඳව සාකච්ඡා කරන විට ඉවසිල්ලෙන් මෛත්‍රියෙන් සහ සමාදානයෙන් යුතුව, ශිෂ්ට ධර්මයන් නොඉක්මවා කළහැකි නම්, මා සිතන හැටියට, එය බුද්ධ ප්‍රතිමාවක් ඉදිරියේ ආහාරපාන වර්ග තැබීමට වඩා උතුම් බුද්ධ පූජාවක් වෙයි. එනිසා නොකිපෙනු මැනවි. මා කියන දෙය ඉවසිල්ලෙන් අසා නුවණින් සිතා බලන්න.

අපේ යම්කිසි ඥාතියකු මළ විට, ඔහු වෙනුවෙන් ආහාරයක් වෙන් කොට තැබුවහොත් එය ඥාති ප්‍රේතයාට බිලි වශයෙනැයි මිනිස්සු කල්පනා කරති. මළගියවුන්ට ආහාර පිදීමේ අදහස එයයි. අපේ ජාතික වීරයකුගේ ප්‍රතිමාවක් ඉදිරියෙහි කෑම බීම තැබුවහොත් එය කෙබඳු දර්ශනයක් වේදැයි සිතා බලන්න. බෞද්ධයෝ ප්‍රතිමාවක් ඉදිරියේ ආහාරපාන වර්ගයන් තබා, විහාර කාමරයෙහි දොර වසා, බුදුරජාණන් වහන්සේගේ ආත්මයට නැතහොත් අවතාරයට අවුත් එය ඉඳුල් කරන්නට ඉඩ දෙන්නාක් මෙන් පිටතට වී ස්වල්ප වේලාවක් බලා සිටිති.

සමහර තැන්වල බෞද්ධයෝ ආසනයක් පනවා එහි වැඩ හිඳින ලෙස ප්‍රතිමාවට ආරාධනා කරති. ඊට පසු, මුව දෝවන්නට පැන්ද, අනෙක් ආහාරපාන වර්ගයන්ද, දැහැත්ද, පඩික්කමක්ද පිළියෙළ කොට තබති. මෙය කොතරම් සිනහ උපදවන බොළඳ වැඩපිළිවෙළක්දැයි සිතා බලනු මැනවි.

ආහාර පානාදී බාහිර දේවල් උසස් හැටියට හැඟෙන්නේ අභ්‍යන්තර දියුණුව අඩු පමණටය. තිරිසනාට සියල්ලටම වඩා උතුම් දෙය ආහාරයයි. ඥානයෙන් සහ ගුණයෙන් දියුණු නොවූ කල්හි වැඩුණු මනුෂ්‍යයා තුළද ඒ අදහස එසේමය.

ශීල, සමාධි, ප්‍රඥාවන්ගෙන් අගතැන්පත් බුදුරජාණන් වහන්සේ වැනි උතුමකුට, උන්වහන්සේ පිරිනිවන්පා අවුරුදු දෙදහස් පන්සියයකට පසුත්, ආහාරපාන වර්ගවලින් ගරු කරන්නට සිතීම අපේ අභ්‍යන්තර ගුණදහම් දියුණුවේ අඩුකම විදහාපෑමකි. බාහිර දෙයකින් උන්වහන්සේට සෑහෙන ගෞරවයක් කරන්නට අපට පුළුවන්කමක් නැත. තමන් වහන්සේට ගෞරවය ප්‍රතිපත්ති පූජාව බව තථාගතයන් වහන්සේ විසින් බලවත් ලෙස දේශනා කරන ලදී.

**එතකොට බාහිර වශයෙන් දානමානාදියෙන් තථාගතයන් වහන්සේට ගරු කිරීම නුවුවමනා ද?**

නැත. එය එසේ නොවේ. බුදුරජාණන් වහන්සේට ආහාර පානයකින් සංග්‍රහ කරන්නට යමෙකුට ඉඩක් ලැබෙතොත් සැබැවින්ම එය මහත් වාසනාවකි. උන්වහන්සේගේ ශරීරයටද, අනෙක් සත්ත්වයන්ගේ ශරීරයට මෙන්, කෑම්, බීම්, ඉඳුම් හිටුම් වලින් ප්‍රයෝජනය ලැබේ. ඒ ජීවමානව සිටියදීය. අද උන්වහන්සේ ජීවමානව නැති බැව් අපි හොඳින්ම දනිමු. එනිසා ආහාර පානාදියකින් උන්වහන්සේට සංග්‍රහයක් කරන්නට අපට ඉඩක් නොලැබීම මහත් කනගාටුවකි.

**මේ ජීවමාන බුදුන්ය යන හැඟීමෙන් ප්‍රතිමාවකට ආහාරපාන වර්ග පිදුවහොත් එය වැරදිද ?**

**නියම බුද්ධ පූජාව යනු කුමක්ද ?**

ප්‍රතිමාවක් පිළිබඳව මේ ජීවමාන බුදුන්ය යන හැඟීමෙන් ගරු සත්කාර කරන බැව් බොහෝ අය කියති. එය එසේම දැයි මට තේරුම්ගත නොහැක. බුදුරජාණන් වහන්සේ ජීවමානව සිටියදී, උන්වහන්සේගේ අසනීපයකට බෙහෙතක් සපයන්නට අපට අවස්ථාවක් ලැබිණි නම්, අහෝ ! එය කෙතරම් වාසනාවක්ද ! අද උන්වහන්සේ ජීවමානය නැති බැවින් උන්වහන්සේගේ රෝගයකට අපට බෙහෙත් කරන්නට ඉඩක් නැත. යම්කිසි ශ්‍රද්ධාවතෙක් ප්‍රතිමාවකට රෝගයක් වැළඳුනාක් මෙන් සිතාගෙන, හොඳ හැටි ඇඳක් සරසා, ප්‍රතිමාව එහි සතපවා සිවුරක් පොරවා, 'වරෝ ! බුදුහාමුදුරුවන්ට අසනීපයක් හැදිලාය' කියා වියදම් කොට වෛද්‍යවරයන් ගෙන්වා, කෂාය උණුකොට ප්‍රතිමාවකට පිළිගන්වයි නම්, මෙය මොන තත්ත්වයේ විහිළුවක්දැයි සිතා බැලිය යුතුයි.

බුදුරජාණන් වහන්සේ ජීවමානය සිටියදී කළහැකි හැම සත්කාරයම උන්වහන්සේ පිරිනිවී පසුත් කරන්නට නුපුළුවන් බැව් සැලකිය යුතුයි. දැන් අපට කළහැකි සත්කාර මොනවාදැයි බැලීම නුවණැතියන්ගේ සිරිතයි.

**එතකොට අප විසින් ඒ ගැන කුමක් කළ යුතුද ?**

ගිලනුන්ට, රෝගීන්ට උපස්ථාන කිරීම උන්වහන්සේට කරන උපස්ථානයකැයි බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලදී. උන්වහන්සේගේ අසනීපයකට අද අපට උවැටන් කරන්නට නුපුළුවන් බැවින්, උන්වහන්සේගේ වචනයට අනුව අප විසින් අසරණ, දුප්පත් රෝගීන්ට කරුණායෙන් සංග්‍රහ කළ යුතුයි. එය උන්වහන්සේට පූජාවයි.

එසේම, අද අපට උන්වහන්සේගේ ප්‍රයෝජනය පිණිස දානයක් දිය නොහැකි බැවින්, අප විසින් කළයුත්තේ නිරාහාරව කුසගින්නෙන් පෙළෙන අසරණයන්ට ඒ වෙනුවෙන් සංග්‍රහ කිරීමයි. එය උන්වහන්සේට කරන ගෞරවයකි.

බෞද්ධන් නුවණ මෙහෙයවා ක්‍රියා කළ යුතුයි. ආහාරය වුවමනා කරන්නේ එය පරිභෝග කළහැකි පුද්ගලයකුටය. යමක් දිය යුත්තේ ප්‍රයෝජනය ගතහැකි පුද්ගලයකුටය. ප්‍රතිමාවකට ආහාරයෙන් ප්‍රයෝජනයක් නැති බැව් අපි හොඳින්ම දනිමු.

එක්තරා පාසලක් අසල පිහිටි විහාරස්ථානයක, විශාල ලෙස ආහාර පූජාව පවත්වනු ලැබේ. විසිතිස් දෙනෙකුට යැපෙන පමණ ආහාර ඉවතලනු ලැබේ. අර පාසලේ ඉගෙනීමට එන ඇතැම් දුප්පත් ළමයි දවල් දහය පමණ වන විට සිහි නැතිව වැටෙති. ඔවුන්ට එක ආහාර වේලකින් සංග්‍රහ කරන කෙනෙක් නැත. බුදුහාමුදුරුවන්ගේ නමින් ප්‍රයෝජනවත් දෙය අඥාන ලෙස අහක දමති. අර දුප්පත් දරුවන්ට සංග්‍රහ කිරීම බුදුරජාණන් වහන්සේගේ වචනය පිළිපැදීම බැඩි ඔවුහු නොදනිති.

ඥානවත් ලෙස ක්‍රියාකරන්නා බෞද්ධයායි. කරන සෑම ක්‍රියාවකම තත්ත්වය නුවණින් විමසිය යුතුයි.

**ප්‍රතිමාවකට ආහාර පානවලින් ප්‍රයෝජනයක් නැති බවත්, ආහාර පානවලින් ප්‍රයෝජනයක් ඇත්තේ පාවිච්චි කළ හැකි අයට බවත් ඇත්තකි. බුද්ධ ප්‍රතිමාවකට පිදීමෙනුත්, අසරණයකුට දීමෙනුත් වඩා පින්සිදුවන්නේ කුමකින්ද ?**

තමාට පින් බලාපොරොත්තුවෙන් යම්කිසි වැඩක් කරතොත් එය සැබැවින්ම වෙළෙඳාමකි. ඵලයට ආශාවෙන් යමෙක් යමක් කරයි නම්, එය උතුම් ක්‍රියාවක් නොවේ. කර්මඵල ඇදැහීම යන්නෙහි නියම තේරුම නම්, යම්කිසි ක්‍රියාවක අවශ්‍යකමත්, එහි ඇති වටිනාකම සහ ප්‍රයෝජනයත් නිසි ලෙස නුවණින් තේරුම් ගැනීමයි. ඵලය තේරුම් ගැනීම එකකි. එයට ආශා කිරීම අනෙකකි. ප්‍රතිමාවක් ඉදිරියේ කෑම බීම තබා අහක දැමීමෙනුත්, කුසගින්නෙන් පෙළෙන අසරණයකුට කරුණාවෙන්, මෛත්‍රියෙන් යුතු සංග්‍රහ කිරීමෙනුත් වඩා අවශ්‍ය ක්‍රියාව කුමක්ද ? වඩා ප්‍රයෝජන ක්‍රියාව කුමක්ද? කියා නුවණින් සිතා බැලිය යුතුයි.

ප්‍රතිමාවක් ඉදිරියේ ආහාර තබන්නේ තමන් පින් ගන්නා ආශාවෙනි. එය තෘෂ්ණාවයි. ප්‍රතිමාවකට ආහාර පූජා කිරීමේදී කරුණා, මෛත්‍රී ආදී ගුණයන් උපදවන්නට ඉඩක් නැති බැවිනි. එහෙත්, අසරණයකුට සංග්‍රහ කිරීමේදී නියම අන්දමින් කරුණා, මෛත්‍රී ආදී ගුණයෝ සිත්හි පහළවෙති.

දානයක් දීමෙන් දායකයා ආනිශංස පහක් ලබයි. ආයුෂ, වර්ණ, සැප, බල, ප්‍රඥා යන මේවායි. මේ ආනිශංස පහ දායකයාට ලැබෙන්නේ, දායකයා දානයක් සමග ඒවා ප්‍රතිග්‍රාහකයාට දෙන බැවිනි. ප්‍රතිමාවක් ඉදිරියේ ආහාරපාන වර්ගයන් තැබීමෙන්, ආයුෂය, වර්ණය, සැපය, බලය, ප්‍රඥාව යන මෙයින් කිසිවකුත් ප්‍රතිමාවට නොලැබෙන බැව් අපට හස්තාමලකයක් මෙන් ප්‍රත්‍යක්ෂය. එනිසා පූජා කරන්නාටද ඒ ආනිසංස ලැබීමට කිසිත් යුතුකමක් නැත. එහෙත් කුසගින්නේ පෙළෙන අසරණයකුට ආහාර පානයන්ගෙන් සංග්‍රහ කළහොත්, මේ ආනිශංස පහ දායකයාට ලැබෙනු නොඅනුමානයි.

මතු සම්බන්ධයි




ලබන කලාපයේ බලාපොරොත්තුවන්න